# වෙළෙඳ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

## Sri Lanka Export Development Board

# ඇබෑර්තු

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

### (1) අධ්‍යක්ෂ ජනරාල් - (HM 2-2)

**පුරප්පාඩු ගණන (01)**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් සහ අවම වශයෙන් වසර 10 ක ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණ සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ සඳහා පිළිගත් ආයතනයක් මගින් සනාථ කරන ලද වාර්තාවක් ලබා තිබිය යුතුයි. ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්දක් සහිත විය යුතුය. තවද, බහුවිද කණ්ඩායම් මෙහෙයවීම, මානව හා අනෙකුත් සම්පත් නිසි ලෙස සංවර්ධන කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරී සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළවන පංතිය හා ඊට ඉහළ නිලධාරීන් ද්විතීයන පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකිය.

**වැටුප් පරිමාණය :**

(HM 2-2) : රු. 93,020/- 12 X 2,700 = රු. 125,420/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස් සීමාව :**

අවුරුදු 55 ට අඩු, ඉහත සුදුසුකම් සහිත පුද්ගලයින් හට මෙම තනතුරට අයදුම් කිරීමේ හැකියාව ඇති අතර, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යාවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

### (2) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා පාලන (HM 2-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරන පරිපාලන සහ මූල්‍යමය කටයුතුවලට අදාළ බලතල/කාර්යයන්/රාජකාරී ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ ආයතනයේ සියලුම අංශ/ඒකක වලට පරිපාලන සහ මූල්‍යමය කටයුතු සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම.

**සුදුසුකම් :**

පහත සඳහන් I, II හෝ III

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ /කලා / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබාතිබීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයක තනතුරට අදාළ විෂය පථයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සමඟ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එයින් වසර පහක් (5) ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

II. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් ගණකාධිකරණ ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / වාණිජ /කලා / ගිණුම්කරණය / මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධියෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර පහක (5) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

(HM 2-1) : රු. 91,645/- 12X 2,700 - රු. 124,045/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස් සීමාව :** අවුරුදු 35ට නොඅඩු සහ 55ට නොවැඩි.

### (3) අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයේ මානව සම්පත් සංවර්ධනය සහ පරිපාලන ක්‍රියාවන් සම්බන්ධ රාජකාරී කටයුතු පිළිබඳ වගකීම් දැරීම, සේවක සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම, විශේෂයෙන්ම කළමනාකරණ ශ්‍රේණි සඳහා ක්‍රමානුකූල මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්, මානව සම්පත් කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් වඩා යෝග්‍ය වන අතර, අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරීන් හට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

### (4) අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයට තොරතුරු තාක්ෂණ සේවා සැපයීම, වෙළඳ ද්වාරයක් පවත්වාගෙන යාම, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, විද්‍යුත් සන්නිවේදනය, ඊ-ප්‍රවර්ධනය යනාදිය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් කිරීම සහ තීරණ ගැනීම යන කරුණු අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ, පරිගණක විද්‍යාව හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක් සඳහා උපාධියක් ලබා තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාව / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

### (5) අධ්‍යක්ෂ - මුදල් (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

මූල්‍ය ප්‍රතිපත්ති සැකසීම, මූල්‍ය කටයුතු සැලසුම් කිරීම සම්බන්ධයෙන් ආයතනයට මගපෙන්වීම හා කළමනාකරණයට තොරතුරු සැපයීම, අයවැය පාලනය, ගිණුම්කරණය, පිරිවැය හා මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ණය මුදල් අයකර ගැනීම, බැංකු කටයුතු හා මුදල් කළමනාකරණය, විගණනය හා රක්ෂණ කටයුතු සම්බන්ධව කටයුතු කිරීම, අපනයන සංවර්ධන අරමුදල වැඩිදියුණු කිරීමේ හා උපදේශනය සම්බන්ධ වගකීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් **හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම **හෝ**

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම **හෝ**

එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම **සහ**

කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**ද්විතීයනය :**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරීන් ද්විතීයන පදනම යටතේ පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

**2021.06.13 දිනැති පුවත්පත් දැන්වීම (අධ්‍යක්ෂ-මුදල් තනතුර) සඳහා ලැබී ඇති අයදුම්පත් ද සළකා බලනු ලැබේ. පෙර අයදුම්කරනු ලැබූවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින්න.**

### (6) අධ්‍යක්ෂ - කෘෂි අපනයන (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

කෘෂි කර්මාන්තය හා ධීවර කර්මාන්තය ගෝලීය මට්ටමට පත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ආකෘතියේ ප්‍රධාන අංගයකි. ව්‍යවසායකයින් දිරි ගැන්වීම සහ නිෂ්පාදන හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා ඇසුරුම්කරණය, සංවර්ධනය හා පුහුණුව ලබා දීම අපනයනකරුවන්ට ගෝලීය අපනයනය වැඩි කිරීමට දායක කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක අලෙවිකරණ / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම හා අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

(HM 1-1) අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, මුදල් සහ කෘෂි අපනයන තනතුරු සඳහා : රු. 80,295/- 15 X 2,270 - රු. 114,345/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස් සීමාව :**

අවුරුදු 55 ට නොවැඩි. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යාවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**2021.06.13 දිනැති පුවත්පත් දැන්වීම (අධ්‍යක්ෂ- කෘෂි අපනයන තනතුර) සඳහා ලැබී ඇති අයදුම්පත් ද සළකා බලනු ලැබේ. පෙර අයදුම්කරනු ලැබූවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින්න.**

### (7) සහකාර අධ්‍යක්ෂ (MM 1-1)

**පුරප්පාඩු ගණන (05)**

**රැකියා විස්තරය :**

වෙළඳ සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම, සැපයුම් සංවර්ධන අවස්ථා හඳුනාගැනීම, කුඩා හා මධ්‍ය පරිමාණ වැඩසටහන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම. අපනයනකරුවන්ට බලපාන සාර්වාර්ථික ප්‍රශ්න වලට අදාළ අධ්‍යයනයන් සිදු කිරීම සහ එම ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රතිපත්තිමය පියවර නිර්දේශ කිරීම, භාණ්ඩ නිෂ්පාදනය, තත්වය උසස් කිරීම සහ ඇසුරුම් සංවර්ධනය කිරීම ආදී අවශ්‍ය උපදේශක සේවා ලබා දීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය/ ජාත්‍යන්තර සබඳතා/ආර්ථික විද්‍යාව/වාණිජ්‍යය/විද්‍යාව/කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාව / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

පළමු හෝ දෙවන පෙළ උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සටහන :** පරිගණක දත්ත කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ පිළිබඳ අවබෝධයක් පැවතීම අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ.

### (8) සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (MM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

මෘදුකාංග පද්ධති සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම. පරිගණක ජාල සහ අදාළ පරිගණක පරිසරයන් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම. තොරතුරු දත්ත පදනම් සහ දත්ත කළමනාකරණ පද්ධති නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම. දත්ත, මෘදුකාංග සහ දෘඩාංග ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම. දත්ත උපස්ථ සහ ආපදා ප්‍රතිපාදන මෙහෙයුම් සිදු කිරීම. උපස්ථ මෙහෙයුම් සිදු කිරීම. පරිගණක ආශ්‍රිත ගැටලු විසඳීමට කාර්ය මණ්ඩලයට සහ පරිශීලකයන්ට සහාය ලබා දීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉලෙක්ට්‍රොනික / විදුලි / විදුලි සංදේශ පිළිබඳ විශේෂ වූ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක්. උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක(01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** ව්‍යුහාත්මක පද්ධති විශ්ලේෂණය සහ සැලසුම් ක්‍රමවේදයන් පිළිබඳ අත්දැකීම්, ක්‍රමලේඛන භාෂා, දත්ත කළමනාකරණ පද්ධති සහ පරිගණක ජාල සහ සේවාදායක පද්ධති පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :**

(MM 1-1) සහකාර අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ තනතුරු සඳහා : රු. 53,175/- 10 X 1,375 - 15 X 1,910- රු. 95,575/= (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**විභාගය සඳහා විෂයයන් පහත දැක්වේ:**

- භාෂා ප්‍රවීණත්වය
- යෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදාළ විෂය දැනුම
- පරිගණක පරීක්ෂණය (තනතුරට අවශ්‍ය නම්)

**වයස් සීමාව :**

අවුරුදු 45 ට නොවැඩි. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යාවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

### (9) අපනයන ප්‍රවර්ධන නිලධාරී (JM 1-1)

**පුරප්පාඩු ගණන (02)**

**රැකියා විස්තරය :**

අංශයේ/ඒකකයේ මෙහෙයුම් කාර්යයන් ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම. අදාළ ක්ෂේත්‍රය සඳහා දත්ත/ තොරතුරු යාවත්කාලීන කිරීම. භාණ්ඩ හා සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ වෙනත් කාර්යයන්හි නිරත වීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය/ ජාත්‍යන්තර සබඳතා/ ආර්ථික විද්‍යාව/ වාණිජ/ විද්‍යාව/ කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

පළමු හෝ දෙවන පෙළ උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

### (10) පරිගණක වැඩසටහන් සම්පාදක (JM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයේ සියලුම අංශ/ඒකක වල පරිගණක කටයුතුවලට අදාළ පරිගණක වැඩසටහන් සංවර්ධනය කිරීම, එම වැඩසටහන් නඩත්තු කිරීම සහ අවශ්‍ය විටදී නව පරිගණක වැඩසටහන් සම්පාදනය කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලකින් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම හෝ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) සාමාජිකත්වය හෝ එක්සත් රාජධානියේ පරිගණක තොරතුරු තාක්ෂණ ආයතනයේ (IMIS) ආශ්‍රිත හෝ පූර්ණකාලීන සාමාජිකත්වය ලබා තිබීම.

### (11) සංඛ්‍යාලේඛන නිලධාරී (JM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

අපනයන අංශයට අදාළ සංඛ්‍යාන තොරතුරු රැස් කර ගබඩා කිරීම, මූලික සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීම සහ දත්ත විශ්ලේෂණය කිරීම, සංඛ්‍යානමය තොරතුරු බෙදා හැරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (සංඛ්‍යානය සහිතව නම් වඩාත් යෝග්‍ය වේ) ලබා තිබීම, පළමු හෝ දෙවන පෙළ උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. පරිගණක දත්ත විශ්ලේෂණය පිළිබඳ දැනුම වාසිදායක වනු ඇත.

### (12) ගිණුම් නිලධාරී (JM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ගණන් තැබීමේ ක්‍රියාවලිය කිරීම, මූල්‍ය පාලනය පවත්වාගෙන යාම, ගබඩාව පාලනය කිරීම, සැපයුම්, විදේශ සංචාර, විදේශ වෙළඳ මධ්‍යස්ථාන, විදේශ මුදල් ගිණුම්ගත කිරීම සම්බන්ධ රාජකාරී කටයුතු සිදු කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම **හෝ** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) මගින් පවත්වනු ලබන අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම ලබා තිබීම **හෝ** වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) මගින් පවත්වනු ලබන අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම **හෝ** වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) මගින් පවත්වනු ලබන අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම **හෝ** ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සමත්ව තිබීම.

**සටහන :** පරිගණක දත්ත කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :**

(JM 1-1) අපනයන ප්‍රවර්ධන නිලධාරී, පරිගණක වැඩසටහන් සම්පාදක, සංඛ්‍යාලේඛන නිලධාරී සහ ගිණුම් නිලධාරී තනතුරු සඳහා : රු. 42,600/- 10 X 755- 18X 1,135- රු. 70,580/= (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**විභාගය සඳහා විෂයයන් පහත දැක්වේ:**

- භාෂා ප්‍රවීණත්වය
- යෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදාළ විෂය දැනුම
- පරිගණක පරීක්ෂණය (තනතුරට අවශ්‍ය නම්)

**වයස් සීමාව :**

අවුරුදු 45 ට නොවැඩි. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යාවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

### (13) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1 – 1)

**පුරප්පාඩු ගණන (12)**

**රැකියා විස්තරය :**

අදාළ අංශය මගින් කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට අයත් සියලුම ලිපි ලේඛන හා ලේකම් වැඩ කටයුතුවල නියැලීම, ලිපිගොනු නඩත්තු කිරීම, වාර්ෂික සහ කාර්තුවලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සහ අධීක්ෂණය කිරීම.

**සුදුසුකම් :**

අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත් වී තිබීම

සහ

අ.පො.ස (උ.පෙ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) කින් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

**අතිරේක සුදුසුකම්**

- යතුරු ලියන වේගය : විනාඩියකට වචන 30 – 40 (ඉංග්‍රීසි / සිංහල)
- ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව
- දුරකථන පද්ධතිය / PABX ක්‍රියාකිරීමේ හැකියාව
- පරිගණක දැනුම සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**වැටුප් පරිමාණය :**

(MA 1 - 1)කළමනාකරණ සහකාර තනතුර (තාක්ෂණික නොවන)තනතුර සඳහා : රු. 27,910/- 10 X 300 – 7 X 350 – 4 X 495 – 20 X 660 - රු. 48,540/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**විභාගය සඳහා විෂයයන් පහත දැක්වේ:**

- භාෂා ප්‍රවීණත්වය
- යෝග්‍යතා පරීක්ෂණය
- පරිගණක පරීක්ෂණය (තනතුරට අවශ්‍ය නම්)
- යතුරු ලියන / ලඝු ලේඛන වේගය

**වයස් සීමාව :**

අවුරුදු 18 ට අඩු සහ 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු,සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**2021.02.19 දිනැති පුවත්පත් දැන්වීම (කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන තනතුර) සඳහා ලැබී ඇති අයදුම්පත් ද සළකා බලනු ලැබේ. පෙර අයදුම්කරනු ලැබූවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින්න.**

## වෙනත් සුදුසුකම් :

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

## ඉහත තනතුරු තනතුර සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :

- ❖ 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ (HM 2 -2, HM 2-1සහ HM 1-1 කාණ්ඩයේ තනතුරු සඳහා පමණි).
- ❖ අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ❖ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපද ණය
- ❖ සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%,ආයතනයෙන් 15% සහ සේවානියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

## අයදුම් කිරීමේ පිළිවෙල :

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ලබාගත් ("Announcements" කාණ්ඩය යටතේ) EDB ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් 2021.07.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර සභාපති සහ ප්‍රධාන විධායක වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2020 දරන 2020.10.26 දිනැති චක්‍රලේඛයට අනුව අනුමත තනතුරු වල පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ වගකීම වෙළෙඳ අමාත්‍යාංශ ලේකම් වෙත පවරා ඇත.

**සභාපති සහ ප්‍රධාන විධායක,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
NDB - EDB **ටවර්,**
**අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**දුර : 011-2300700**